# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2018/2019

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2021 අගෝස්තු)**

## BLE 309 - ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති හා සංවර්ධනය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

**(1) ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(6) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

01.

i. කොවිඩ් 19 වසංගතය හමුවේ රටකට තිබිය යුත්තේ කුමන ආකාරයේ විදේශ විනිමය ප්‍රතිපත්තියක්ද?

(ලකුණු 05)

ii. විදේශ විනිමය ඉල්ලුමට හා සැපයුමට බලපාන සාධක කොවිඩ් 19 වසංගතය සමග කුමන ආකාරයට හැසිරේද?

(ලකුණු 05)

iii. පාවෙන විනිමය අනුපාතය පැවතීම කොවිඩ් 19 වසංගතය හමුවේ ශ්‍රී ලංකාවට සිදුවූ බලපෑමක් විග්‍රහ කරන්න.

(ලකුණු 05)

iv. කොවිඩ් 19 වසංගතය හමුවේ සිදුවූ ආර්ථික බලපෑම අවම කිරීම සඳහා විදේශ විනිමය පාලනය ක්‍රියාත්මක කිරීම කෙසේ කළ යුතුද? විග්‍රහ කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

02.

i. කොවිඩ් 19 වසංගතය සමඟ රටතුල ආර්ථික කටයුතු සීමා වීම නිසා රටෙහි උද්ධමනය හැසිරීම විස්තර කරන්න.

(ලකුණු 05)

ii. මෙම කොවිඩ් 19 වසංගතය හමුවේ සිදුවූ තත්වයන් නිසා රටතුළ ඇතිවිය හැක්කේ ඉල්ලුමෙන් ඇදුන උද්ධමනයක් ද එසේ නැතිනම් පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයක් ද, එසේ නම් එය විස්තර කරන්න.

(ලකුණු 05)

iii. කොවිඩ් 19 වසංගතය සමඟ ආර්ථික කටයුතු කළමනාකරණයට අනුගමනය කල උද්ධමන පාලන ප්‍රතිපත්ති විස්තර කරන්න.

(ලකුණු 05)

iv. කොවිඩ් 19 වසංගතය සමඟ වූ ආර්ථික පසුබෑමට පිළියමක් ලෙස විදේශ ආයෝජන හා විදේශ ණය කෙතරම් ඉවහල් වේද? විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

03.

i. කොවිඩ් 19 වසංගතයේ ආර්ථික පසුබෑම හමුවේ දිළිදුබවේ විෂම චක්‍රය හැසිරෙන ආකාරය විග්‍රහ කරන්න.

(ලකුණු 05)

ii. දේශීය ඉතිරිකිරීම් පසුබෑමට ලක් වූ ආර්ථිකය නගා සිටුවීමට කුමන ආකාරයට යොදා ගත හැකිද?

(ලකුණු 05)

iii. කොවිඩ් 19 වසංගතය නිසා වූ ලෝක ආර්ථික පසුබෑම හා ශ්‍රී ලංකා ආර්ථිකයේ අඩපණ වීම ගෙවුම් ශේෂ ලේඛනයට කුමන බලපෑමක් ඇතිකරන්නේ දැයි යන්න පිළිබඳ විග්‍රහ කරන්න.

(ලකුණු 05)

iv. ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ හිගය අවම කරගැනීම සඳහා රජය ගනු ලැබූ ක්‍රියාමාර්ග හා ඒවායේ සාර්ථක/අසාර්ථක භාවය පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

04.

i. කොවිඩ් 19 වසංගතය සමග ආර්ථික කටයුතු කළමනාකරණයට ගනු ලැබූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කවරේද? ඒවා කෙතරම් සාර්ථක වූවාදැයි විස්තර කරන්න.

(ලකුණු 05)

ii. කොවිඩ් 19 වසංගතය හමුවේ ලෝක ගෝලීයකරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා ආර්ථිකයට සිදු කල බලපෑම පිළිබඳව සවිස්තරාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 05)

iii. ගෝලීයකරණ ප්‍රතිපත්තියේ අපේක්ෂිත වාසිදායී තත්වයන් ශ්‍රී ලංකාවට ලබා ගැනීමට හැකි වූ ආකාරය පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 05)

iv. කොවිඩ් 19 වසංගතය හමුවේ ජාත්‍යන්තර වෙළදාමට සිදු වූ බාධාකාරී තත්වයන් විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

05.

i. ආතර් ලුවිස් ගේ ද්විත්ව ආර්ථික න්‍යායේ ග්‍රාමීය අංශයේ හා නාගරික අංශයේ ලක්ෂණ මොනවාද?

(ලකුණු 05)

ii. ආතර් ලුවිස් ගේ ද්විත්ව ආර්ථික න්‍යායේ වාසි පිළිබඳව විස්තර කර කොවිඩ් 19 වැනි වසංගත හමුවේ එම වාසි ලබාගත හැකිද?

(ලකුණු 05)

iii. තිරසාර සංවර්ධන ඉලක්ක 17 නම් කරන්න.

(ලකුණු 05)

iv. ශ්‍රී ලංකාවේ වර්තමාන වෙළඳ ප්‍රතිපත්තිය විග්‍රහ කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

06.

i. රටක ආදායම් ව්‍යාප්තිය යන්නෙන් ඔබ හඳුනාගන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. රටක ආදායම් විෂමතාවය මැනීම සඳහා යොදාගන්නා මිනුම් 05 ක් කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 05)

iii. ශ්‍රී ලංකාවේ පසුගිය දශක දෙක තුළ ආදායම් විෂමතාවයේ උපනතිය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. ශ්‍රී ලංකාවේ ආදායම් විෂමතාවය අවම කිරීම සඳහා ගතහැකි ක්‍රියා මාර්ග 05 ක් විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

07.

i. “දිළිදුකම” පිළිබඳ නිර්වචන 05 ක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 04)

ii. “දිළිදුකම” මැනීම සඳහා යෙදාගත හැකි මිනුම් 05 ක් නම්කොට ඒවා විස්තර කරන්න.

(ලකුණු 04)

iii. මෑත වර්ෂ තුල ශ්‍රී ලංකාවේ දිළිදුකමේ උපනතියේ ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iv. ශ්‍රී ලංකාවේ දිළිදුකම නැතිකිරීම සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති 05 ක් තෝරාගෙන ඒවායේ සාධනීය ලක්ෂණ සහ අඩුපාඩු පැහැදිලි කරන්න.

(ලකුණු 04)

v. මෙරට දිළිදුකම නැතිකිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 05 ක් තෝරාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

08. 2020 වර්ෂයේ ශ්‍රී ලංකා ආර්ථිකයේ හැසිරීම පිළිබඳ පහත මාතෘකා යටතේ රචනයක් ලියන්න.

i. විදේශ අංශයේ හැසිරීම.

(ලකුණු 04)

ii. රාජ්‍ය ණය සහ ණය වාරික ආපසු ගෙවීම.

(ලකුණු 04)

iii. සේවා අංශයේ දායකත්වය.

(ලකුණු 04)

iv. ගෙවුම් ශේෂ ප්‍රශ්නය හා විදේශ විනිමය අර්බුදය.

(ලකුණු 04)

v. රාජ්‍ය අයවැය ලේඛනය හා එහි හිඟය පියවීම.

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

***************